**දෙවිනුවර ප්‍රාදේශීය සභාව - 2021**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උපලේඛන, හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, ඉඩම් හා ගොඩනැගිලි ලේඛන හා සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.8,825,338 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | අදාල උපලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ කහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 571 | වසර 02 ඉක්මවූ රු.1,357,269 ක රඳවුම් තැන්පතු ශේෂ 219 ක් සම්බන්ධයෙන් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.19,207,364 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 25,266,485 ක් විය.

### 2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

------------------------------------

(අ) වරිපනම්

----------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ වරිපනම් ඒකක 3582 ක් පැවති අතර වර්ෂය අවසානයට වරිපනම් ඒකක 651 කින් රු.5,081,031 ක හිඟ ශේෂයක් පැවතුණි. | රටේ පැවති කොරෝනා වසංගත හේතුවෙන් සංචරණ සීමා පනවා තිබූ බැවින් හිඟ අය කර ගැනිමට නොහැකි වූ බව. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතුය. |

(ආ) අක්කර බදු

-------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.73,778ක හිඟ ශේෂයක් පැවතුණි. | පත් කරන ලද නව කමිටුව මඟින් සමීක්ෂණ කටයුතු ආරම්භ කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

(ඇ) බදුකුලී

----------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ කඩ කාමර 146 ක් බදු දී තිබූ අතර වර්ෂය අවසානයට කඩ කාමර 91කින් රු.12,858,556 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම අය කර ගැනීමට බදුකරුවන් ලිඛිතව දැනුවත් කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තලල්ල කලපුව පාරේ වර්ග මීටර් 289.30 බැඟින් වූ මහල් 2කින් යුක්ත හෝටල් ගොඩනැගිල්ලක් නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ඉදිකර තිබූ අතර නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග / රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරණ ගැසට් නිවේදනයේ 02 වන උප ලේඛනය ප්‍රකාර ව කටයුතු කර වර්ග මීටරයක් සඳහා රු.1500 බැඟින් වර්ග මීටර් 578.6 වෙනුවෙන් රු.867,900ක ගාස්තු අය කර ඉදිකිරීම් විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණ පිළිගන්නා බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 සපිරි ගමක් ජනතා සහභාගීත්ව වැඩසටහන යටතේ තලල්ල දකුණ මුහන්දිරම් වත්ත පාර කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් එක්තරා කොන්ත්‍රාත්කාර සමිතියකට සමාලෝචිත වර්ෂයේ දී රු.432,831ක් ගෙවා තිබුණ ද නියමිත ඝනකමට කොන්ක්‍රීට් අතුරා නොතිබීම, මාර්ගයට අතුරන ලද කොන්ක්‍රීට් මිශ්‍රණය Grade 20 ශක්තිය නොමැති වීම සහ කොන්ත්‍රාත් පිරිනැමීම අවිධිමත් ලෙස සිදු වී ඇති බව නිරීක්ෂණය විය. | මෙම කර්මාන්තවලට ගෙවීම් කිරීමේදී Core සාම්පල ලබා ගැනීමක් සිදු නොකළ අතර දින 7න් හා දින 28න් ශක්තිය මැන බැලීමේ තත්ව පරීක්ෂණ වාර්තා පදනම් කර ගනිමින් ගෙවීම් කළ බවත්, කොන්ත්‍රාත් සමිති මගින් ණය පදනම මත ඉටුකිරීමේ හැකියාව ඇති බවට දිවුරුම් ප්‍රකාශ ලබා ගෙන කොන්ත්‍රාත් පිරිනැමීම සිදු කර ඇති බව. | නියමිත ප්‍රමිතියට අනුව ඉදිකිරීම් කළ යුතු අතර කොන්ත්‍රාත් පිරිනැමීම විධිමත්ව කළ යුතුය. |
| (ආ) | 2021 මාර්තු 18 දින සභා තීරණය මත බැද්දෙගම්මැද්ද වොලිබෝල් ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා රු. 1,467,466 ඇස්තමේන්තුවක් පිළියෙල කර එක්තරා ප්‍රජා සංවර්ධන සමිතියකට සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 4 දින පවරා තිබුණි. 2022 පෙබරවාරි 23 දින වන විට ක්‍රීඩාංගනය ඉදි කිරීමට සභාව සතු ඉඩමෙන් ආර්ථික වටිනාකමක් ඇති පස් කියුබ් 141.28 කපා එයින් පස්කියුබ් 14ක් පමණ භූ විද්‍යා හා පතල් කාර්යාංශයෙන් ලබා ගන්නා ලද බලපත්‍රයෙහි සඳහන් නොවූ දෙවිනුවර සභාපතිගේ ඉදිකරමින් පවතින හෝටලයකට ගාස්තු අය කිරීමකින් තොර ව සභාවේ රියදුරන් හා කම්කරුවන් යොදා ප්‍රවාහනය කර තිබුණි. | කපන ලද පස් ලොරි රථවලට පැටවීමට පමණක් ලියාපදිංචි අංක ZA 5646 දරණ බැකෝ යන්ත්‍රය කුලී පදනම මත කොන්ත්‍රාත් සමිතියට ලබා දී ඇති බවත්, භූ විද්‍යා හා පතල් කාර්යාංශයෙන් ලබා ගන්නා ලද බලපත්‍රයෙහි පස් දමනු ලබන ස්ථානද සඳහන් කර තිබූ අතර එම ස්ථාන සඳහා අදාල කොන්ත්‍රාත් සමිතිය විසින් පස් ගෙනවිත් දමා තිබුණු බව. | වඩාත් ඵලදායී ආකාරයට සභාව සතු සම්පත් භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019/2020 වර්ෂ වලදී උස්වත්ත පාර පැති බැම්ම දමා සංවර්ධනය කිරීමේ කර්මාන්තයට රු.170,476ක් අවස්ථා දෙකකදී අවිධිමත් ලෙස ගෙවා තිබිය දී නැවත 2018 අප්‍රේල් 02 කොන්ත්‍රාත්කාර සමිතිය විසින් ව්‍යාජ බිල් පතක් ඉදිරිපත් කර සමාලෝචිත වර්ෂයේදී ගෙවීම සඳහා ඉදිරිපත් කර තිබුණි. | නිරීක්ෂණ පිළිගන්නා බව. | ඉටුකළ වැඩ සඳහ පමණක් ගෙවී කළ යුතුය. |